**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | --------------------- |
| (i) | බදුරලිය නගරයේ ඉදිකර තිබූ රු.16,574,529 ක් වූ කඩ කාමර සංකීර්ණය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කල යුතුය. | 2020 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ප්‍රග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත කිරීමේදී රු.428,025 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (iii) | වායු සමීකරණ යන්ත්‍රයක හා පරිගණක උපාංගයක එකතු වටිනාකම වූ රු.243,500 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | තොග වටිනකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.917,395 ක්වූ පොත් අගය ගිණුම්ගතකර තිබුණි. | භෞතික තොග වටිනාකම ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයට අදාල රු.252,450 ක් වු ස්ථාවර තැන්පතු පොලී ආදායම්ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂ වලට අදාල වටිනාකම රු.649,574 ක් වු කර්මාන්ත ණයහිමි ශේෂය නිරවුල් කිරීමට සහාව කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේදි ගෙවීම් කිරිමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය , අයිතිය දැක්වෙන ලේඛන , ඔප්පු හා පැවරුම් නියෝග , භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා යාවත්කාලීන කරන ලද ඉන්වෙන්ට්‍රි ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.138,071,892 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූලාා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1. 4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | මුදල | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (i) 134(1) වගන්තිය | - | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ නව තක්සේරුවක් කිරීමට නියමිතව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) 160 වගන්තිය | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී දේපළ තහනම් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන චක්‍රලේඛය | - | වරිපනම් වලට අයත් වන දේපළ වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේදී නව තක්සේරු කිරිමට නියමිතය. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,516,080 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,678,732 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
---------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 177,290 | 2,240,964 | 2,207,492 | 212,599 | 263,712 | 2,259,271 | 2,342,647 | 177,290 |
| (ii) | කුලී | 357,963 | 6,627,410 | 6,689,827 | 295,546 | 249,638 | 5,493,701 | 5,385,376 | 357,963 |
| (iii) | බලපත්‍ර ගාස්තු | - | 291,000 | 291,000 | - | - | 292,000 | 292,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,810,709 | 8,083,094 | 4,817,206 | 16,065,364 | 13,927,229 | 7,081,746 | 10,198,596 | 10,810,709 |
| | | 11,345,962 | 17,242,468 | 14,005,525 | 16,573,509 | 14,440,579 | 15,126,718 | 18,218,619 | 11,345,962 |

2.2.2 වරිපනම් බදු
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය තුල වර්ෂ 01 ට අඩු ඒකක 137 ක් වෙනුවෙන් හිඟ රු.68,624 ක් | හිඟ ආදායම් අයකර ගත යුතුය. | වර්ෂ 05 ට වැඩි හිඟ සහිත බදු කරුවන් බහුතරයක් සොයා ගැනීමට නොහැකි වී ඇත. |

ද, වර්ෂ 01-03 අතර ඒකක 50 ක් වෙනුවෙන් හිඟ රු.33,232 ක් ද, වර්ෂ 03-05 අතර ඒකක 02 ක් වෙනුවෙන් හිඟ රු.3,089 ක් ද , වර්ෂ 05 ට වැඩි ඒකක 90 ක් වෙනුවෙන් රු.53,732 ක් ද විය.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
----------------------------

(අ) උසාවි දඩ
-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,600,000 ක් විය. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

(ආ) මුද්දර ගාස්තු
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මුද්දර ගාස්තු ලෙස රු.14,310,000 ක් ලැබිය යුතුව තිබූ අතර 2020 ජුනි 30 වන විට තවදුරටත් රු.7,698,080 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතුය. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම<br>---------------------<br>විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | නිවැරදිව ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතුය. | 2020 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්මේ ව්‍යාපෘති ඉටු නොකිරීම හා පරිභාහිර ව්‍යාපෘති ඉටු කිරීම<br>------------------------------------------<br>වර්ෂය තුල ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුල පිරිවැය රු.මි.03 ක් වූ ව්‍යාපෘති 15 ක් හඳුනාගෙන තිබුණද ව්‍යාපෘති 07 ක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. පිරිවැය | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතුය. පරිභාහිරව කරනු ලබන කාර්යයන් වෙනුවෙන් | බල ප්‍රදේශයේ අවශ්‍යතාවය මත ව්‍යාපෘති ඇතුලත් කලද, පළාත් සභාවට ලැබෙන ඉල්ලීම් මත ව්‍යාපෘති සඳහා |

| | | |
|---|---|---|
| රු.1,551,612 ක් වූ ව්‍යාපෘති 05 ක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් නොකර ක්‍රියාත්මක කර තිබුණි. | අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. | මුදල් එවනු ලබයි. සභා අරමුදලින් ඉටු කරනු ලද ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරිමට කටයුතු කරමි. |

(ඇ) වාර්ෂික නඩත්තු සැලසුම් සකස් කිරීම

-----------------------------------------

| | | |
|---|---|---|
| මංමාවත් හා බෝක්කු නඩත්තු වෙනුවෙන් රු.1,500,000 ක් අයවැයගත කර තිබුණ ද සැලැසුම් සකස් කර නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි. | නිවැරදි නඩත්තු සැලැස්මක් සකස් කල යුතුය. | 2020 වර්ෂයේ සිට නඩත්තු සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරමි. |

(ඈ) අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම

--------------------------------------------

| | | |
|---|---|---|
| මහජනතාව වෙත පානීය ජලය ලබාදීම වෙනුවෙන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කටුහේන අක්කර විස්ස පානීය ජල ව්‍යාපෘතිය රු.762,541 ක් වැයකර 2019 සැප්තැම්බර් මස වැඩ අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ අරමුණ මේ දක්වා ඉටුවී නොතිබුණි. | ව්‍යාපෘතියක් අවසානයේ ඉන් අපේක්ෂිත අරමුණ ලබා කර ගැනීම කල යුතුය. | ඉතා කඩිනමින් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරිමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | -------------- | ------------------------------- |
| (අ) | අගලවත්ත ප්‍රාදේශිය සභාව 2006 අප්‍රේල් 15 දින සිට පාලින්දනුවර හා අගලවත්ත යනුවෙන් ප්‍රාදේශිය සභා දෙකකට වෙන් වී තිබූ නමුත් පාලින්දනුවර ප්‍රාදේශිය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකීම් බෙදා වෙන් කර ගැනීමට 2020 ජුනි 12 වන විටත් නොහැකි වී තිබුණි. | වත්කම් හා වගකීම් බෙදා වෙන්කර ගැනිම ඉක්මනින් සිදු කල යුතුය. | පළාත් පාලන අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව මැදිහත්ව කටයුතු කරමින් පවති. |
| (ආ) | පළාත් සංවර්ධන ප්‍රදාන 2018 යටතේ රු.750,000 ක පිරිවැයක් දරා විදුලිබල සංරක්ෂණය සඳහා විකල්ප බලශක්ති භාවිතයට යොමු කිරිමේ අරමුණින් මසකට ඒකක 300ත් 325 ත් අතර ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති පද්ධතියක් සභා ගොඩනැගිල්ල තුල සවි කර තිබුණ ද 2020 ජුනි 12 දින වන විටත් විදුලි බිලෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් අඩු වී නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කල පසු එහි ප්‍රගතිය මැන බැලීමට කටයුතු කල යුතුය. | මෙම බල ප්‍රදේශය නිරන්තර වැසි සහිත කාලගුණයක් පවතින බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුස්තකාලාධිපති, ආදායම් පරීක්ෂක හා රියදුරු තනතුරක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවකයින් 12 දෙනෙකු 2019 ජූනි මස සිට බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු.1,755,635 ක් වැටුප් වශයෙන් සහා අරමුදලින් ගෙවා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත බඳවාගත යුතුය. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් ආදේශක පදනමින් බඳවා ගෙන වැටුප් ගෙවන ලදි. |

3.4 වත්කම් කළමණාකරණය

3.4.1 වත්කම් ලේඛනගත කිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගොඩනැගිලි සහ මෝටර්රථ හා කරත්ත යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | භෞතිකව පවතින සියළුම වත්කම් ලේඛනගත කර පවත්වා ගැනිමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ සිට නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කරමි. |

3.4.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 19 දින සිදු කරනු ලැබූ ගබඩා භෞතික පරික්ෂාවේදී වටිනාකම රු.23,250 ක් වූ GI බට 21 ක හා වටිනාකම රු.85,750 ක් වූ පකිස්ථාන් බට 49 ක ඌනතාවයක් නිරික්ෂණය විය. | අලාභ අයකර ගැනීමට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | මු.රෙ. 104 කිරිමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය

---------------

ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ සිට විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------

පළාත් ගිණුම්කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරිම

---------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 04 හා 11 යන දිනවල පැවති පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 1.2 (ඇ), 1.3.3(i) , 1.3.3 (vi) , 1.5 , 1.6 (ii) , 2012 විගණකාධිපති වාර්තාවේ 2.1.1 (ඇ) , 2.2 (ආ)(i) , 2.2.4 (ආ) (ii) සහ 2013 විගණකාධිපති වාර්තාවේ 1.2.2 (ආ), 1.3.2 යන ජේද සම්බන්ධයෙන් දී තිබූ නියෝග 2020 ජුනි 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | නිවැරදි කිරිමට ක්‍රියා මාර්ග ගත යුතුය. | 2020 වර්ෂයේදී පරික්ෂණ කටයුතු කර අවසන් කිරිමට කටයුතු කරමි. |